ශ්‍රී ලංකා විගණන සේවා සංගමය
இலங்கை கணக்காய்வுச் சேவை சங்கம்
SRI LANKA AUDIT SERVICE ASSOCIATION

ජාතික විගණන කාර්යාලය, අංක: 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

මගේ අංකය / எனது இல. / My No. } SLAUS/2023/පොදු
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2023 නොවැම්බර් 16 දින

කථානායකතුමා,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභාවේ සභාපතිගේ ක්‍රියාකලාපය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු පාලනයට සිදුවන අහිතකර බලපෑම වළකාලීම.

---

රුපියල් ට්‍රිලියන ගණනාවක වාර්ෂික මෙහෙයුම් පිරිවැටුමක් සහිත රාජ්‍ය ආයතන 500 කට අධික ප්‍රමාණයක ගිණුම්කටයුතුභාවය, වගවීම, මෙහෙයුම් ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපති වාර්තා මගින් අනාවරණය වන කරුණු විමර්ශනය කොට නිර්දේශ ලබා දීම හා එකී ආයතනයන් වෙත පැවරී ඇති කටයුතු නිසි ගණන්දීමේ වගවීම සහිතව ඉටුකර ඇත්ද යන්න පරීක්ෂා කොට සෑම මාස 03කට වරක් පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 120 යටතේ පොදු ව්‍යාපාර කාරක සභාව පිහිටුවා ඇත.

නව වැනි පාර්ලිමේන්තුවේ 2 සැසිවාරය ආරම්භයෙන් පසු පොදු ව්‍යාපාර කාරක සභාව සඳහා පත්කර ඇති සභාපති වරයා තනතුර වෙත පැවරී ඇති ප්‍රමුඛතම කාර්යන් පිළිබඳ කිසිදු අවබෝධයකින් තොරව අත්තනෝමතිකව හා පක්ෂග්‍රාහීව එම කාරක සභාව මෙහෙයවන බවට එහි සාමාජික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, සාමාජික නොවන පාර්ලිමේන්තු මැති ඇමති වරුන්ගෙන් මෙන්ම එම කාරක සභාවේ කටයුතු විමර්ශනශීලීව අධ්‍යයනය කරන මහජනතාවගෙන් විරෝධය මතු වන තත්ත්වයක් උද්ගතවී ඇත.

2022 සැප්තැම්බර් මස සිට පත් වූ නව සභාපතිවරයා විසින් මෙහෙයවනු ලැබූ කොප් කමිටු සඳහා සම්බන්ධව වූ අප සංගමය නියෝජනය කරන ජාතික විගණන කාර්යාලයේ විධායක නිලධාරීන්ගෙන් ද වර්තමාන කොප් කමිටු සභාපති සම්බන්ධයෙන් විවිධ චෝදනා සංගමය වෙත දැනුම් දී ඇති අතර ඒවා පහත පරිදි සම්පිණ්ඩනය කර ඇත.

1. එක් එක් ආයතන පිළිබඳව විගණකාධිපතිතුමා විසින් කෝප් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන සාකච්ඡා සටහනෙහි ඇතුළත් ප්‍රමුඛතම හා සැලකිල්ලට ගත යුතු විශේෂ කරුණු මහහැර සාපේක්ෂව අඩු අවධානමක් සහිත කරුණු ඉස්මතු කරමින් එම කරුණු වැඩිවේලාවක් සාකච්ඡාවට ගැනීම මගින් විශේෂ හා ප්‍රධාන කරුණු කෝප් කමිටු සාකච්ඡාවෙන් උපක්‍රමශීලීව මඟ හරින බව පෙන්වාදීම.

ගරු සභාපති: ඊ. ඒ. ඩී. ප්‍රසාද් ප්‍රසන්න
Hon President: E. A. D. Prasad Prasanna
Tel : 0714 273 573
Email : prasannaead@gmail.com

ගරු ලේකම්: ආර්. එම්. පී. ඒ. ජානක
Hon Secretary: R. M. P. A. Janaka
Tel : 0718 464 654
Email : a.rmpa@yahoo.com

2. කමිටුව මගින් විමර්ශනය කරන කරුණු සම්බන්ධයෙන් නිශ්චිත නිර්දේශ හෝ මාර්ගෝපදේශ ලබා දීම මගහැරීම, එකී කරුණු අනාගත කමිටුවක් වෙත නැවත යොමු කිරීම මගින් කල් මැරීම හා නිගමනයකින් තොරව සාකච්ඡාව අවසන් කිරීම මගින් කමිටුවේ වගකීම පැහැර හරින බව පෙන්වාදීම.

3. කෝප් කමිටුව පැවැත්වෙන අතරතුර විමර්ශනට ලක්වන ආයතනවල කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් සමඟ හස්ත මුද්‍රාවෙන් උපදෙස් ලබාදීම හා කරුණු දැක්වීම් වල දී ආයතන සාමාජිකයින්ට වාසිදායක වන ලෙස කටයුතු කරන බව පෙන්වාදීම.

4. කෝප් කමිටුව පැවැත්වීමට පූර්ව දිනයක දී කමිටුව වෙත ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා ඇතුළු නියෝජිතයින් සමඟ සාකච්ඡාකර එකී කරුණු නිවැරදිව වටහාගෙන ඊට අනුකූලව සභාව මෙහෙයවීම සඳහා හිටපු සභාපතිවරුන් විසින් පූර්ව කෝප් කමිටු රැස්වීමක් පැවැත්වූ නමුත් එවැනි කමිටු රැස්වීමක් පැවැත්වීමේ සම්ප්‍රදායෙන් බැහැරව කටයුතු කරන බව පෙන්වාදීම.

උක්ත කරුණු සලකා බැලීමේ දී මෙම කෝප් කමිටු සභාපතිවරවරයාගේ ක්‍රියාකලාපය මගින් පාර්ලිමේන්තු මූල්‍ය පාලන වගකීම නිසිලෙස ඉටු නොවන බව පැහැදිලි වේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව මගින් පාර්ලාමේන්තුව වෙත පැවරී ඇති රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වගකීම නිසි ලෙස ඉටු නොවන තත්ත්වයක් නිර්මාණය වී ඇති අතර එමගින් ජනතා පරමාධිපත්‍ය බලය බරපතල ලෙස හැල්ලුවට ලක්වන හෙයින් වර්තමාන කෝප් කමිටු සභාපතිවරයා එම ධූරයෙන් ඉවත්කර, මෙම ඉහළ වගකීමක් සහිත තනතුර සඳහා එම ධූරයේ වගකීම් නිසිලෙස ඉටු කළ හැකි මනා පරිචයකින් යුත් මන්ත්‍රීවරයෙක් පත්කරන ලෙස ඉල්ලමු.

විධායක සභාවේ අණ පරිදි,

ටී.ඒ.ඩී.පි ප්‍රසාද් ප්‍රසන්න
ගරු සභාපති

ආර්.එම්.පි. ජානක
ගරු ලේකම්

පිටපත: අතිගරු ජනාධිපතිතුමා
සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන්
විගණකාධිපතිතුමා